# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.11.04 පැය 1540 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/1989/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**සමාජ මාධ්‍ය ඔස්සේ සංසරණය වන පුද්ගලයෙකුට පහරදීමේ වීඩියෝවට අදාළව සැකකරු අත්අඩංගුවට ගැනීම.**

කොටුව පොලිස් වසමේ ගාලු මුවදොර ප්‍රදේශයේදී පුද්ගලයෙකුට පිරිසක් විසින් පහර දෙන අයුරු දැක්වෙන වීඩියෝ පටයක් සමාජ මාධ්‍ය ඔස්සේ සංසරණය වී ඇත. මෙම වීඩියෝ දර්ශණය සම්බන්ධයෙන් කොටුව පොලිස් ස්ථානය මඟින් සිදු කල විමර්ශනයේදී පුද්ගලික මගී ප්‍රවාහන සේවයට අයත් බස් රථයක කොන්දොස්තරවරයෙකු හා තවත් පුද්ගලයෙකු විසින් බස් රථයේ ගමන් ගන්නා ලද මගියෙකුට ටිකට් පතට අදාල මුදල සම්බන්ධයෙන් ඇති වූ ආරවුලක් මත මෙසේ පොල්ලකින් පහරදීම සිදු කර ඇති බවට අනාවරණය වී ඇත.

ඒ අනුව, 2025.11.03 වන දින කොටුව බස්නැවතුම්පොලේදී කොටුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මෙම පහරදීම සම්බන්ධව සැකකරුවකු වන අදාල බස් රථයේ කොන්දොස්තරවරයා අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 35 ක් වන පානදුර තිරිබේරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු 2025.11.04 වන අද දින කොටුව ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු 2025.11.14 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. කොටුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**